## දේශීය ආදායම් දිරි දීමනා අරමුදල 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දිරිදීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

ශේෂ පත්‍රයෙහි දක්වා තිබුණු රු.94,000 ක් වූ කාර්යාල උපකරණ සහ රු.326,119 ක් වූ ක්‍රීඩා භාණ්ඩ 2009 පෙබරවාරි 20 දින එල්ලවූ ත්‍රස්ත ප්‍රහාරයෙන් විනාශ වී තිබුණු අතර ඉතිරි රු.267,719 ක් වූ කාර්යාල උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ හඳුනා ගැනීමට අදාල සාක්ෂි නොතිබුණි.

### 1.2.2 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 3.2 ඡේදය ප්‍රකාර ක්‍රියාත්මක නොවන අරමුදල් වසා දැමීමට කටයුතු කළ යුතු වුවත්, 2006 වර්ෂයේ සිට දිරි දීමනා වැය ශීර්ෂ ප්‍රතිපාදනවලින් ගෙවීම් කිරීම හේතුවෙන් දේශීය ආදායම් දිරි දීමනා අරමුදල ක්‍රියාකාරී අරමුදලක් ලෙස නොපැවතියද එම අරමුදල වසා දැමීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශේෂ පත්‍රයෙහි දක්වා තිබුණු රු.5,109,075 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවලට අදාල සියලු විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි.

### 2. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) නිවාස ප්‍රතිලාභ ක්‍රමයේ ණය පාලනය

(ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය

(ඇ) අරමුදල වසා දැමීමේ ක්‍රියාපරිපාටිය